ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

**පුවත්පත් නිවේදනය**

**<u>2026 වෙසක් මංගල්‍යය: පොදු බෞද්ධ වටිනාකම් පිළිබිඹු කරමින් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ විශේෂ වැඩසටහන් රැසක්</u>**

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ගැඹුරින් මුල් බැසගත් බෞද්ධ සහ ශිෂ්ටාචාරමය සබඳතා සමරමින් ශ්‍රී ලංකාවේ ඉන්දිය මහ කොමසාරිස් කාර්යාලය 2026 වසරේ වෙසක් මංගල්‍යය නිමිත්තෙන් වැඩසටහන් රැසක් සංවිධානය කර තිබිණ.

2. 2026 ජාතික වෙසක් උත්සවයේ කොටසක් ලෙස ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සහ සම්බත්තොට ඉන්දියානු කොන්සියුලර් ජෙනරාල් කාර්යාලය මාතර, මිදෙල්ලවෙල පුරාණ විහාරය හා එක්ව "ඉන්දියාවේ බෞද්ධ උරුමය" යන මැයෙන් විශේෂ ඡායාරූප ප්‍රදර්ශනයක් සංවිධානය කර තිබිණ. මෙම ප්‍රදර්ශනය ඉන්දිය මහ කොමසාරිස් අතිගරු සන්තෝෂ් ජා මැතිතුමාගේ සහභාගිත්වය සහිතව ජනාධිපති අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමා විසින් විවෘත කරන ලදී. බුදුන් වහන්සේගේ ජීවිතය සහ ඉගැන්වීම් හා සබැඳි පූජනීය ස්ථාන, ඓතිහාසික ආරාම, ස්ථූප, පුරාවිද්‍යා නටබුන් සහ යුනෙස්කෝ ලෝක උරුම ස්ථානවල ඡායාරූප හරහා ඉන්දියාවේ පොහොසත් බෞද්ධ උරුමය ප්‍රදර්ශනය කෙරෙන මෙම ප්‍රදර්ශනය මැයි 27 වන දින සිට ජූනි 2 වන දින දක්වා මහජනතාව සඳහා විවෘතව තිබේ.

3. වෙසක් මංගල්‍යය හා බැඳී තිබෙන දයාවේ සහ ත්‍යාගශීලීත්වයේ පණිවිඩය ලබා දෙමින් ඉන්දිය මහ කොමසාරිස් කාර්යාලය 2026 මැයි 30 වන දින කොළඹ, සමස්ත ලංකා බෞද්ධ සම්මේලන පරිශ්‍රයේදී විශේෂ දන්සැලක් ද සංවිධානය කර තිබිණ. මහ කොමසාරිස් කාර්යාලය ඉන්දියාවේ ශ්‍රී භග්වාන් මහාවීර් විකලාංග සහායත සමිති හා සහයෝගීතාවයෙන් අවශ්‍යතා සහිත අයට නොමිලේ කෘත්‍රිම අත් පා ලබා දෙන ජයිපූර් ෆූට් ඉන්දියා මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු සමාරම්භ කිරීම සඳහා සමස්ත ලංකා බෞද්ධ සම්මේලනය සමඟින් එක් විය. මෙම මධ්‍යස්ථානය "සව් සුව" නමින් පැවැත්විණ.

4. උතුම් වෙසක් දිනය සමරමින් මහ කොමසාරිස් කාර්යාලය ගංගාරාම විහාරයේ සීමාමාලකයේදී "ධම්ම ඡායා" නමින් විශේෂ ප්‍රදර්ශනයක් සංවිධානය කර තිබූ අතර එම ප්‍රදර්ශනය 2026 මැයි 31 වන දින අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මැතිනිය විසින්

විවෘත කරන ලදි. ප්‍රදර්ශනය ජූනි 2 වන දින දක්වා මහජනතාව සඳහා විවෘතව පවතිනු ඇත. නව දිල්ලියේ ජාතික කෞතුකාගාරයේ සහ කොල්කටාවේ ඉන්දියානු කෞතුකාගාරයේ තිබෙන ගෞතම බුදුන් වහන්සේගේ ජීවිතය නිරූපිත ඉන්දියානු කලා නිර්මාණ මෙම ප්‍රදර්ශනයට ඇතුළත් වේ. ළමා පරපුර අතර බෞද්ධ වටිනාකම් සහ සංස්කෘතික අවබෝධය ප්‍රචලිත කිරීම සඳහා සිංහලට පරිවර්තනය කරන ලද ජාතක කතා ඇතුළත් චිත්‍ර කතා පොත් ද ප්‍රදර්ශනය හා සමගාමීව බෙදා දෙන ලදි.

5. මෙම මුලපිරීම් දෙරට අතර සුවිශේෂී පොදු බෞද්ධ උරුමය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ඉන්දිය රජය සහ කොළඹ, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් දරනු ලබන අඛණ්ඩ ප්‍රයත්නයේ කොටසකි. මෙම වසර මුලදී, ගුජරාටයේ දෙව්නිමෝරි සර්වඥ ධාතූන් වහන්සේලා ද ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශනය කෙරුණු අතර එම ප්‍රදර්ශනය 2025 අප්‍රේල් මස සිය ශ්‍රී ලංකා සංචාරය අතරතුර දී ඉන්දිය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් නිවේදනය කරන ලදි. මිලියනයකට අධික ජනතාවක් ධාතූන් වහන්සේලා වැඳ පුදා ගත්හ. මෙයට පෙර ද සාරානාත් සහ කපිලවස්තු ධාතූන් වහන්සේලා ද ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශනය කරන ලදි. පොදු බෞද්ධ උරුමය ප්‍රවර්ධනය කිරීම සඳහා ඉන්දියාවේ කැපවීම 2020 සැප්තැම්බර් මාසයේදී නිවේදනය කරන ලද ඇමරිකනු ඩොලර් මිලියන 15ක ප්‍රදානය තුළින් ද පිළිබිඹු විය. ශ්‍රී ලංකාව පුරා ආසන්න වශයෙන් බෞද්ධ විහාරස්ථාන සහ පිරිවෙන් 9000කට පමණ නොමිලේ සූර්ය විදුලිබලය ලබා දීම වැනි වැදගත් ව්‍යාපෘතීන් මේ යටතේ ක්‍රියාත්මක වෙමින් පවතී. 2025 අප්‍රේල් සිය ශ්‍රී ලංකා සංචාරය අතරතුරදී, අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා අනුරාධපුර පූජනීය නගර සංකීර්ණ ව්‍යාපෘතිය සඳහා ද ඉන්දියානු ආධාර ලබා දෙන බව ප්‍රකාශ කළේය.

6. මෙම පොදු බෞද්ධ උරුමය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර දිගුකාලීන මිත්‍රත්වය තවත් ශක්තිමත් කරයි.

***

*2026 ජූනි 2*
කොළඹ